දුරකථන / தொலைபேசி / Telephone: 2698471, 2698475, 2698490
ෆැක්ස් / பெக்ஸ் / Fax: 2693866
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் முகவரி / e-mail: postmaster@health.gov.lk
www.health.gov.lk

මගේ අංකය / எனது இல / My No.: NCD/41/2011
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2019.07.18

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
சுகாதாரப் போசணை மற்றும் சுதேச வைத்திய அமைச்சு
Ministry of Health Nutrition & Indigenous Medicine

පොදු චක්‍රලේඛන අංකය : 01 - 46 / 2019

සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්,
සියලුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්,
සියලුම විමධ්‍යගත ඒකකවල ප්‍රධානීන්,
සියලුම ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂකවරුන්,
අධ්‍යක්ෂක ජාතික සෞඛ්‍ය විද්‍යායතනය,
සියලුම වෛද්‍ය අධිකාරිවරු/දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරීන්/ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී /ස්ථාන භාර වෛද්‍ය නිලධාරීන්,
සියලුම ආයතන ප්‍රධානීන්,

## සෞඛ්‍ය සේවා ආයතන වල සුව දිවි මධ්‍යස්ථාන සඳහා මාර්ගෝපදේශනය

බෝ නොවන රෝගී තත්ත්වයන් හා එම රෝගී තත්ත්වයන්ගේ සංකූලතා අඛණ්ඩව වැඩිවීමේ ප්‍රවණතාවත්, සේවාලාභීන්ගේ අඩු සහභාගීත්වයත් සලකා බලා, සුවදිවි මධ්‍යස්ථාන මඟින් සපයන සේවා සහ පහසුකම් තවදුරටත් වැඩි දියුණුකරලීම සඳහා ඒ සම්බන්ධව පවත්නා වූ මාර්ගෝපදේශණ සංශෝධනය කිරීමට සෞඛ්‍ය, පෝෂණ හා ආයුර්වේද වෛද්‍ය අමාත්‍යාංශය මගින් තීරණය කර ඇත.
එම සංශෝධන මෙසේය ,

1. පූර්ව රෝග පරීක්ෂාවට සුදුසු පුද්ගලයන් කාණ්ඩ දෙකකට අයත් වේ.
   අ. අවුරුදු 35 හෝ ඊට වැඩි
   ආ. වයස අවුරුදු 20-35 අතර පහත කුමන හෝ අවදානම් තත්ත්වයන් ඇති
      i. දුම්පානය කරන පුද්ගලයන් (පසුගිය වසර තුල)
      ii. අධිබර (ඉනවට ප්‍රමාණය සෙ.මී.90 ට වැඩි පිරිමි, ඉනවට ප්‍රමාණය සෙ.මී.80 ට වැඩි ගැහැණුන් හෝ ශරීර ස්කන්ධ දර්ශකය 25 $Kg/m^2$ ට වැඩි පුද්ගලයන්)
      iii. අධිරුධිර පීඩනය (දියවැඩියාව ඇති හෝ නැති 140/90 mmHg ට වැඩි පුද්ගලයන්)
      iv. දියවැඩියා රෝගී ලක්ෂණ ඇති පුද්ගලයන්
      v. අඩු වයසකින් හෘදවාහිනී පද්ධතියේ රෝගී තත්ත්වයක් ඇතිව ළඟම ඥාතියෙකු ඇති පුද්ගලයන් (දෙමව්පිය, සහෝදර හෝ දරුවන්)
         (පිරිමි පුද්ගලයෙකු නම් වයස අවුරුදු 55 ට පෙර / ස්ත්‍රියක නම් වයස අවුරුදු 65 ට පෙර
      vi. දියවැඩියාවෙන් පෙළෙන ළඟම ඥාතියෙකු ඇති පුද්ගලයන් (දෙමව්පිය, සහෝදර හෝ දරුවන්)
      vii. ජාන සම්භවය නිසා හට ගන්නා ලිපිඩගත රෝග

❖ මීට අමතරව, සුවනාරි සායනයට සහභාගී වන අවුරුදු 35 ට වැඩි සියලුම ස්ත්‍රීන් ලඟම ඇති සුවදිවි සායනයට යොමු කල යුතු අතර වයස අවුරුදු 35 හා 45 යන වයස් කුලකයන් තුල සිටින, සුවදිවි මධ්‍යස්ථානයට සහභාගී වන්නාවූ සියලුම ස්ත්‍රීන්, අදාළ සුවනාරි සායනයට යොමු කල යුතුය. සුවනාරි හා සුවදිවි මධ්‍යස්ථාන හරහා සේවා සැපයීම පිළිබඳව අදාල ස්ථාන දෙකේම කාර්ය මණ්ඩලය දැනුවත් විය යුතුය.

2. සුවදිවි මධ්‍යස්ථායට සහභාගි වන සේවාලාභීන් සඳහා පහත සඳහන් සායනික හා රුධිර පරික්ෂාවන් සිදුකල යුතුය.
   i. ශරීර ස්කන්ධ දර්ශකය
   ii. රුධිර පීඩනය
   iii. රුධිර නිරාහාර සීනි මට්ටම හෝ රුධිර දළ සීනි මට්ටම(රුධිර නිරාහාර සීනි මට්ටම නොමැති විට)
   iv. රුධිර කොලෙස්ටෙරෝල් මට්ටම

3. සායන වාරයක් පැවැත්වීම

සුවදිවි මධ්‍යස්ථානයකට අවම වශයෙන් සතියකට වරක් සේවාලාභීන් 20 දෙනෙකුගේ සහභාගීත්වයෙන් සායනය පැවැත්විය යුතුය. අවශ්‍ය වන්නාවූ සියළුම සම්පත් ඇති සියළුම සුවදිවි මධ්‍යස්ථාන සඳුදා සිට සෙනසුරාදා දක්වා විවෘත ව තැබිය යුතුය. පුරුෂ සේවාලාභීන්ගේ සහභාගීත්වය හා රැකියාවල නියුතු ජනතාවගේ පූර්ව රෝග පරික්ෂා කටයුතු වැඩිකරලීම සඳහා සුවදිවි සායන, සවස 6 තෙක් හෝ /හා පොදු නිවාඩු දිනයන්හි අදාල සියලුම බලධාරීන්ගේ අවසර හා අනුමැතිය ඇතිව විවෘත කර තැබිය හැකිය.

බෝ නොවන රෝග කලින් හදුනාගැනීම විධිමත් කරලීම සදහා සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් මෙම මාර්ගෝපදේශනය නිකුත් කරනු ලබන්නේ, 15/01/2013 වන දින නිකුත් කරනු ලැබූ මාර්ගෝපදේශන චක්‍රලේඛනය වන, පොදු චක්‍රලේඛන අංක 02-25/2013, 2017/12/05 දින නිකුත් කරනු ලැබූ පොදු චක්‍රලේඛන අංක 01-66/2017 හා 2017/12/22 වන දින නිකුත් කරනු ලැබූ පොදු චක්‍රලේඛන අංක 01-68/2017 යන චක්‍රලේඛනයන්ට වැඩිමනක් වශයෙනි.

වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත් :

1. අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය සේවා, වෛද්‍ය සේවා)
2. සියලුම නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල්වරුන්
3. සියලුම අධ්‍යක්ෂවරුන්

— කාරුණික දැනගැනීම පිණිසයි.